ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව 2010

වාර්ෂික වාර්තාව

2010

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත් කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2010 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2010 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජනිතා ඒ ලියනගේ.
අධ්‍යක්ෂ

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
අධ්‍යක්ෂගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2010 - 2015 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2010.06.28 දින පැවැති 174 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ.
අධ්‍යක්ෂ.

පටුන

	කාරණය	පිටු අංකය
01.	ආයතනයේ දැක්ම	01
02.	මෙහෙවර ප්‍රකාශය	02
03.	අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය	03
04.	සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	04
05.	දේශීය සිසුන් පිළිබඳ විස්තර	04
06.	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	04
07.	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර	05 - 06
08.	අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර	06
09.	පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	07
10.	වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	07
11.	සම්මාන ලැබීම් පිළිබඳ විස්තර	08
12.	ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර	08
13.	පුනරාවර්තන වියදම් විස්තර	08
14.	ප්‍රාග්ධන වියදම් විස්තර	09
15.	ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය)	09
16.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය)	10
17.	මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	10
18.	මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම්)	10
19.	මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2010	11
20.	යටිතල පහසුකම් සඳහා 2010 වර්ෂය තුළ ලැබීම්	11
21.	වෙනත් විස්තර	11
22.	අධ්‍යක්ෂ වාර්තාව	12 - 13
23.	2010.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය	14
24.	2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය	15
25.	විගණකාධිපති වාර්තාව	16 - 23
26.	විගණකාධිපති වාර්තාවට අදාළ පිළිතුරු	24 - 27

1. ආයතනයේ දැක්ම :

දැක්ම

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින් ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ඨ මධ්‍යස්ථානය බවට පත් වීම.

2. මෙහෙවර ප්‍රකාශය :

මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මෙහෙවර වනුයේ, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පහත දැක්වෙන අරමුණු හා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම ය.

" මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින් ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම "

3. අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය :

අ. හැඳින්වීම

ආයතනයේ දක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2010 - 2014 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2010.06.28 දින පැවැති 174 වන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

ආ. ජයග්‍රහණ

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

ඇ. අඩුපාඩු

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතු ය.

ඈ. අනාගත සැලසුම්

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

විෂය නිර්දේශ සංශෝධන කිරීමට කටයුතු මේ වසර පුරා ද ක්‍රියාවට නැංවුණ අතර 2011 වසර තුළ දී එය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. එමෙන්ම ආයතනය මගින් යෝජනා කර ඇති නව ගොඩනැගිලිවලින් ගොඩනැගිලි 02 ක් ආරම්භ කිරීමට හැකිවීම මෙහිලා සඳහන් කළ යුතුව ඇත. ආයතනයේ අඩුපාඩුවක්ව පැවැති කම්කරු තනතුරු කීපයක් සඳහා පුද්ගලයන් බඳවා ගැනීමට හැකිවීම තුළින් ආයතනයේ නඩත්තු කටයුතු බොහොමයක් ආයතනය තුළින්ම ඉටු කර ගැනීමට හැකි වූ බවද සඳහන් කළ හැක. 2010 දෙසැම්බර් මාසය තුළ ආයතනික විමසුම පැවැත්වීමට හැකිවීම ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

4. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය (කැලණිය) B.A.M.S.	330 (5 වසර සිසුන් ද ඇතුළුව)	30	102
මුළු ගණන		330	30	102

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම 2010	පළමු වසර සිසුන්	2 වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4 වන වසර සිසුන්	උපාධිය ලබාගත් මුළු ගණන
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (2010 වර්ෂයේ සිට - මාධ්‍යය - ඉංග්‍රීසි)	B.A.M.S.	සිංහල	120	99	87	51	38	54
		ඉංග්‍රීසි						
මුළු ගණන				99	87	51	38	54

2009/2010 අධ්‍යයන වර්ෂයේ නවක සිසුන් සඳහා දේශන පැවැත්වීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කර ඇති අතර වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය 120 දක්වා වැඩි කර ඇත.

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම	පළමු වසර සිසුන්	2 වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4 වන වසර සිසුන්	උපාධිය ලබාගත් මුළු ගණන
මුළු ගණන								

7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

ආයතනය	විෂය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය	උපදේශක-වරුන්
ශල්‍ය ශාලක්‍ය	ශල්‍ය	සිංහල ඉංග්‍රීසි	-	-	01	-	-	-
	ශාලක්‍ය	සිංහල	-	-	01	-	-	-
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග	ස්ත්‍රීරෝග	සිංහල	-	-	02	-	01	02
	කෞමාරභෘත්‍යය	සිංහල						
	ප්‍රසූත තන්ත්‍ර	සිංහල						
ද්‍රව්‍යගුණ විඥාන	ද්‍රව්‍යගුණ විඥාන	සිංහල	-	01	04	-	-	-
	රස ශාස්ත්‍ර	සිංහල	-	-	02	-	-	ප්‍රදර්ශක 03
	භෛෂජ්‍ය කල්පනා	සිංහල	-	-	02	-	-	-
ආයුර්වේද මූලධර්ම	ඉංග්‍රීසි හින්දි සංස්කෘත	ඉංග්‍රීසි සිංහල	-	-	01 -	01	01 ආධුනික	01 බාහිර
	ආයුර්වේ ඉතිහාසය		-					
	පදාර්ථ විඥානය							
	ශරීරරචනා ආයුර්වේද				02			
	ශරීර ක්‍රියා ආයුර්වේද							
	දෝෂධාතු මලවිඥාන						01 ආධුනික	
	වෘද්ධත්‍රය		-					
	ශරීර රචනා නව්‍ය					-	01	01 බාහිර
	ශරීර ක්‍රියා නව්‍ය							
චිකිත්සා	රෝග විඥාන	-	-	-	08	02	-	-
	කාය චිකිත්සා							

	දේශීය චිකිත්සා							
	අගද තන්ත්‍ර							
	ස්වස්ථවෘත්ත							
	ව්‍යාධිවේදය							
	ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව හා ධූලක වේදය							
	පර්යේෂණ ක්‍රමවේදය							
මුළු ගණන				01	23	03	04	07

මෙම අධ්‍යයනාංශය යටතේ පවත්නා ශරීර ක්‍රියා විෂය කටයුතුවලට අදාළ විෂයයන් ඉදිරියේ දී වෙනමම අධ්‍යයනාංශය බවට පත් කිරීමේ අරමුණින් සම්බන්ධීකාරකවරයෙකු යටතේ පවත්වාගෙන යාම ආරම්භ කර ඇත.

8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

ආයතන අංශය/ අංශය	විධායක කාර්ය මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික	මාණ්ඩලික	කණිෂ්ඨ	සුළු සේවක
චිකිත්සා	-	01	03	-	02
ශල්‍ය ශාලක්‍ය	-	-	02	-	01
ස්ත්‍රීරෝග හා කෞමාරභෘත්‍ය	-	-	02	-	01
ද්‍රව්‍යගුණ විඥාන	-	-	03	01	01
මූලධර්ම + වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය	*01	01	04	03	02
පාලන	02	02	10	06	04
නඩත්තු	-	01	01	04	07
විභාග	01	04	04	01	01
ගිණුම්	02	03	08	-	02
පුස්තකාලය	02	-	03	03	01
පරිගණක		02	01	-	01
මුළු ගණන	08	14	41	18	23

2010 වසරේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නව පත්වීම් 11 ක් කරනු ලැබිණ.

* **ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී**

9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර :

විෂයය	ප්‍රකාශිත	මුදල් ඉපයීම්	ඉදිරිපත් කිරීම්
අ. පර්යේෂණ ගණන	මූලධර්ම	-	03
	ශල්‍ය ශාලක්‍ය 04	-	01
	ස්ත්‍රීරෝග 08	-	-
	චිකිත්සා 15		10
ආ. නව සොයා ගැනීම්	-	-	-
ඇ. සඟරා ගණන	-	-	-
ඈ. පොත් ගණන	-	-	-
ඉ. ලිපි ගණන	ස්ත්‍රීරෝග 06 චිකිත්සා 07	-	-
ඊ. වෙනත්	ස්ත්‍රීරෝග 06	-	-
මුළු ගණන	46		14

10. වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර :

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පශ්චාද් උපාධි වැඩසටහන්			
මූලධර්ම	05		
ශල්‍ය		04	
චිකිත්සා	03	02	
ආ. පශ්චාද් ඩිප්ලෝමා වැඩසටහන්			
චිකිත්සා	02	02	
ඇ. උපාධි වැඩසටහන්			
ඈ. ඩිප්ලෝමා වැඩසටහන්			
ඉ. සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන්			
ස්ත්‍රීරෝග	26	26	
චිකිත්සා		03	03
ඊ. වෙනත්			
ද්‍රව්‍යගුණ	41		
චිකිත්සා	28		
මුළු ගණන	105	37	03

11. සම්මාන ලැබීම් පිළිබඳ විස්තර :

	විෂයය	සම්මාන ගණන	අධ්‍යයන කාර්ය මණ්ඩලය	සිසුන් ගණන
අ. දේශීය සම්මාන	චිකිත්සා	01	-	-
ආ. ජාතික සම්මාන			-	-
ඇ. ජාත්‍යන්තර සම්මාන			-	-
ඈ. වෙනත්			-	-
මුළු ගණන		01	-	-

12. ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර :

අධ්‍යයනාංශය	පාඨමාලාව	මාධ්‍යය	සහතික පත්‍ර	ඩිප්ලෝමා	පශ්චාද් ඩිප්ලෝමා	පශ්චාද් උපාධි	දර්ශනපති	දර්ශනශූරී
ද්‍රව්‍යගුණ විඥාන	ආයුර්වේද ෆාමසි	-	-	✓	-	-	-	-
ශල්‍ය ශාලක්‍ය	ක්ෂාරසූත්‍ර	සිංහල	✓	-	-	-	-	-
ස්ත්‍රීරෝග හා කෞමාරභෘත්‍ය	ආයුර්වේද රූපලාවන්‍ය	සිංහල	✓	-				
	ස්කෑනින් උපකරණ භාවිතය	සිංහල	✓	-	-	-	-	-
පශ්චාත් උපාධි අංශය	රෝහල් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා	සිංහල ඉංග්‍රීසි	-	-	✓	-	-	-
	යෝග හා සංයම අභ්‍යාස පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සිංහල	✓	-	-	-	-	-
මුළු ගණන			04	01	01			

ආයුර්වේද විෂය ක්ෂේත්‍ර පුළුල් කිරීමේ අදහසින් නව ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා කිහිපයක් මෙම වසර තුළදී අළුතින් ආරම්භ කර ඇත.

13. පුනරාවර්තන වියදම් විස්තර :

විෂයය	2009	2010
අ. පුද්ගල පඩිනඩි	62,790,391.00	69,320,645.00
ආ. ගමන් වියදම්	227,967.00	214,634.00
ඇ. සැපයුම්	4,127,666.00	4,242,138.00
ඈ. නඩත්තු	2,956,176.00	3,961,463.00
ඉ. ගිණුම්ගත සේවා/පර්යේෂණ, සංවර්ධන	11,403,413.00	12,757,081.00
ඊ. වෙනත්/ පාඨමාලා වියදම්	3,365,933.00	7,300,373.00
මුළු ගණන	84,871,546.00	97,796,334.00

14. ප්‍රාග්ධන වියදම් විස්තර :

විෂයය	**2009**	**2010**
a. ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම	4,823,972.00	2,553,657.00
b. වාහන මිල දී ගැනීම	1,134,000.00	-
c. පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	9,416,210.00	1,976,020.00
d. ඉදිකිරීම්	-	32,742,461.00
මුළු ගණන	15,374,182.00	37,272,138.00

පසුගිය වසරේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද නව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගෙවන ලද බිල්පත් හේතුවෙන් ප්‍රාග්ධන වියදම ප්‍රමාණය ඉහළ ගොස් ඇත.

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) :

නම සහ විස්තර	**ණය/ආධාර**	**ආධාර දෙන ආයතනය**	**මුළු පිරිවැය**	**වෙනස**
වෛද්‍ය බන්දුල වීරසූරිය මහතා 2006 2008 2009	753,000.00 753,000.00 700,000.00	National Centre for Advanced Studies	753,000.00 753,000.00 655,092.24	- - 44,907.76
වෛද්‍ය ඩබ්.ජී.එල්. චන්ද්‍රසිරි මහතා 2006 2008 2009	687,150.00 687,150.00 687,150.00	National Centre for Advanced Studies	687,150.00 687,150.00 528,351.28	- - 158,798.72
වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මහතා	287,470.79	NCAS	219,747.79	67,723.00
කේ.එම්. චන්දිමාල් මහතා	250,000.00	U.G.C. Research Fund	66,116.85	183,883.15
වෛද්‍ය තිස්ස හේවාවිතාන මහතා	250,000.00	U.G.C. Research Fund	21,596.00	228,404.00
වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය	250,000.00	U.G.C. Research Fund	213,849.90	36,150.10
වෛද්‍ය රූපා මදනායක මෙනෙවිය	250,000.00	U.G.C. Research Fund	200,256.00	49,744.00
වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මහතා	250,000.00	U.G.C. Research Fund	42,117.27	207,882.73
වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය	250,000.00	U.G.C. Research Fund	44,055.38	205,944.62
වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙනෙවිය	250,000.00	U.G.C. Research Fund	14,500.00	235,500.00
වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය	250,000.00	U.G.C. Research Fund	41,868.25	208,131.75
එස්.ඒ.ආර්.පී. දිසානායක මහතා	55,000.00	U.G.C. Research Fund	12,000.00	43,000.00

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය)

නම	මුළු ඇස්තමේන්තු පිරිවැය	වියදම 2009	වියදම 2010	සමුච්චිත වියදම් 2010.12.31 දිනට	ප්‍රගතිය (%)
වෛද්‍ය බන්දුල වීරසූරිය මහතා	2,206,000.00	640,842.00	331,037.50	2,161,092.24	98
වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මහතා	2,061,450.00	599,671.00	163,700.00	1,902,651.28	92
වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මහතා	287,470.79	103,348.84	116,398.95	219,747.79	76
කේ.එම්. චන්දිමාල් මහතා	250,000.00	161,627.05	73,219.80	234,846.85	94
වෛද්‍ය තිස්ස හේවාවිතාන මහතා	250,000.00	77,246.50	146,345.00	223,591.50	89
වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය	250,000.00	105,759.00	108,090.90	213,849.90	86
වෛද්‍ය රූපා මදනායක මෙනෙවිය	250,000.00	122,352.00	77,904.00	200,256.00	80
වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මහතා	250,000.00	-	42,117.27	42,117.27	17
වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය	250,000.00	-	44,055.38	44,055.38	18
වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙනෙවිය	250,000.00	-	14,500.00	14,500.00	6
වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය	250,000.00	-	41,868.25	41,868.25	17
එස්.ඒ.ආර්.පී. දිසානායක මහතා	55,000.00	-	12,000.00	12,000.00	22

17. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) :

විෂයය	2010 ප්‍රතිපාදන	2010 වියදම්	ඉතිරි/ඉක්මයාම (සීමාව ඉක්මවීම)
අ. පුනරාවර්තන නොවන ව්‍යාපෘති	89,525,000.00	97,796,334.00	
ආ. ප්‍රාග්ධන නොවන ව්‍යාපෘති	45,875,000.00	37,272,138.00	
ඇ. ව්‍යාපෘති - දේශීය ආධාර			
ඈ. ව්‍යාපෘති - විදේශ ආධාර			
මුළු ගණන	1,35,400,000.00	1,35,068,472.00	

18. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම) :

ආදායම් ප්‍රභවය	ප්‍රතිපාදන/වෙන්කිරීම් ඇස්තමේන්තු	ලැබීම් 2010	අඩු/වැඩි
අ. උපාධි අපේක්ෂක	1,682,000.00	2,936,953.00	
ආ. පශ්චාද් උපාධි			
ඇ. උපදේශක			
ඈ. වෙනත්/පාඨමාලා මුදල්වලින්			
මුළු ගණන	1,682,000.00	2,936,953.00	

19. මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2010

විෂයය	සංකේතය	ඒක ශිෂ්‍ය පිරිවැය
අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව		289,561.00
ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව		114,683.00
මුළු ගණන		404,244.00

20. යටිතල පහසුකම් සඳහා 2010 වර්ෂය තුළ ලැබීම් :

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	ලැබීම්	වියදම්	ප්‍රගතිය
ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම්	4,900,000	2,670,505.82	
ඉදිකිරීම්	117,700,000	92,979,290.32	වැඩ නිම වී ඇත.

21 වෙනත් විස්තර :

- කාන්තා රෝග සහ ළමා රෝග සඳහා දිනපතා සායන පැවැත්වීම මගින් සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වැඩි කිරීම.
- අද සමාජයේ බහුලව පවතින ගැටළුවන දරුඵල නොමැතිකම, ගර්භාෂගත අර්බුද, ගර්භාෂය පහත්වීම සහ ඩිම්බකෝෂගත ග්‍රන්ථි (P-C.OD) වැනි අවස්ථාවලදී යොදනු ලබන විශේෂ චිකිත්සා ක්‍රම පිළිබඳව සිසු/සිසුවියන් සඳහා පුහුණුව ලබාදීම සහ රෝගීන් දැනුවත් කිරීම සඳහා සිසුන් පුහුණු කිරීම.
- සහජ විකෘති වශයෙන් ඇතිවන අවස්ථා මන්දබුද්ධික තත්ව සහ සුව කිරීමට අපහසු විශේෂ ළමාරෝග තත්ත්වයන් සඳහා ආයුර්වේද ඖෂධ යෙදීම සහ පංචකර්ම චිකිත්සා, නිල චිකිත්සා උපයෝගී කරන ආකාරය පිළිබඳව සිසු සිසුවියන් පුහුණු කිරීම.
- 2010 වසර දෙසැම්බර් මාසයේ ආයතනික විමසුමට අදාළ කටයුතු නිම කිරීම.
- පුස්තකාල ගොඩනැගිල්ල හා ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීමට කටයුතු ආරම්භ කිරීම.
- B.A.M.S. පාඨමාලාව සංශෝධන කටයුතු ඉදිරියට ගෙන යාම.
- විද්‍යායතනයේ පැවැති අධ්‍යයනාංශ දෙකට අමතරව අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා නව අධ්‍යයනාංශ 03 ක් අළුතින් ආරම්භ කිරීම.

අධ්‍යක්ෂ වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 වර්ෂයට අදාල මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

2010 වර්ෂය සඳහා ආයතනය වෙනුවෙන් මහාභාණ්ඩාගාරය විසින් ලැබුන අධාර මුදල් පහත දක්වේ.

පුනරාවර්තන ආධාර

රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර	-	89.52
ආයතනය මගින් උපයන ලද පුනරාවර්තන ආදායම	-	06.63
	-	96.15

එකතු කළා

ක්‍රමක්ෂය	-	9.58
මුළු එකතුව (පුනරාවර්තන)	-	105.73

මූලධන ආධාර

වැය ශිර්ෂ	101	-	පුරුත්ථාපන සහ නඩත්තු සඳහා	-	3.00
වැය ශීර්ෂය	102	-	උපකරණ, පුස්තකාල පොත් හා	-	2.87
		-	වාර සඟරා අත්පත් කර ගැනීම		
වැය ශීර්ෂය	103	-	ගොඩකැගිලි ඉදි කිරීම්	-	40.00
මුළු එකතුව (ප්‍රාග්ධන)					45.87

ආදායම

2010 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රු. 89,525,000 ක් වන අතර, විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනිකුත් පුනරාවර්තන ආදායම් මාර්ගවලින් ලබා ගත් මුදල රු. 6,625,834 හා ක්‍රමක්ෂය ගැලපීම් කටයුතු සමග රු. 9,583,323 ක් ද ඇතුළුව මුළු ආදායම රු.105.734,157 කි.

වියදම

2010 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රු. 107,379,657 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රු.1,645,500 කි.

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2010 වර්ෂය තුළ රු. 9,583,323/- වෙන් කර ඇත.

2010 වර්ෂයේදී රු. මිලියන 3 ක් පුනරාවර්තන හා නඩත්තු වෙනුනේ ලැබී ඇත. ඉන් රු.1,976,020/- ක් වැය කර ඇත.

<u>වර්ෂයේ මූලධන ප්‍රතිපාදන ප්‍රතිඵලය</u>

වැය ශීර්ෂ අංක 101 - නඩත්තු හා වැඩි දියුණු කිරීම්

2010 වර්ෂය සඳහා 101 ව්‍යාපෘතිය යටතේ රු. 3,000,000/- ක මුදලක් ආයතනයට වෙන් කෙරුණු අතර, වර්ෂයේ නඩත්තු හා වැඩිදියුණු වියදම් වශයෙන් රු. 1,976,020 ක මුදලක් වැය කර ඇත.

වැය ශීර්ෂ අංක 102 - කාර්යාල උපකරණ, අධ්‍යයන උපකරණ, පොත්පත් හා වාර සඟරා මිල දී ගැනීම්.

2010 වර්ෂය සඳහා රු. 2,875,000/- ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ආයතනයට වෙන් කරන ලද අතර, අදාල මිල දී ගැනීම් සඳහා රු. 2,553,656/- ක මුදලක් වැය කර ඇත.

වැය ශීර්ෂ අංක 103 - ඉදි කිරීම් කටයුතු

2010 වර්ෂය සඳහා රු. 40,000,000/- ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ආයතනයට වෙන් කරන ලද අතර, අදාල ඉදිකිරීම් කටයුතු සඳහා රු. 32,742,461/- ක මුදලක් වැය කොට ඇත.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

2010.12.31 දිනට මුල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනය

	2010		2009	
	Rs.	Rs.	Rs.	Rs.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
(අ) ඉඩම	4,277,790		4,277,790	
(ආ) ගොඩනැගිලි	52,176,891		54,618,180	
(ඇ) කාර්යාල උපකරණ	8,890,518		8,498,580	
(ඈ) අධ්‍ය. හා රසා.උපකරණ	2,328,077		3,730,360	
(ඉ) ලී බඩු හා සවි කිරීම්	2,882,946		3,451,492	
(ඊ) පුස්තකාල පොත්	2,167,215		2,850,720	
(උ) මෝටර් රථ වාහන	1,630,547		1,931,425	
(ඌ) යන්ත්‍රෝපකරණ	1,089	74,355,073	9,690	79,368,237
(එ) වෙනත්		1,866,855		2,119,354
(ඒ) නිම නොවූ වැඩ		9,446,956		1,242,340
(ඔ) මූලධන අත්තිකාරම්		24,537,845		
ආයෝජන				-
ස්ථාවර තැන්පත්		9,721,231		2,979,375
		119,927,960		**85,709,306**
ජංගම වත්කම්				
(අ) ගබඩා අත්තිකාරම්	2,333,509		2,460,850	
(ආ) ණය ගැතියෝ	1,139,840		1,273,640	
(ඇ) ණය සහ අත්තිකාරම්	19,091,896		20,812,783	
(ඈ) මිශ්‍ර අත්තිකාරම්	-		94,828	
(ඉ) පර්යේෂණ අත්තිකාරම්	53,500		-	
(ඊ) පෙර ගෙවීම	37,063		231,934	
(උ) බැංකු ශේෂය	29,277,564		18,068,124	
(ඌ) සුළු මුදල් ශේෂය	180		180	
(එ) වෙනත් වත්කම්	750,597	52,684,149	726,572	43,668,911
මුළු වත්කම්		172,612,109		129,378,217
වගකීම්				
(අ) ජංගම වගකීම්	441,450		280,950	
(ආ) ගෙවීම්	6,538,398		3,737,775	
(ඇ) උපචිත වියදම්	2,944,616	9,924,464	3,940,725	7,959,450
ජංගම නොවන වගකීම්				
(අ) පාරිතෝෂික දීමනා වෙන් කිරීම්		25,778,315		24,325,006
මුළු වගකීම්		35,702,779		32,284,456
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		136,909,330		97,093,761
ශුද්ධ වත්කම්/හිමිකම්				
(අ) වැය කළ ප්‍රාග්ධනය	127,203,071		99,514,256	
(ආ) වැය නොකළ ප්‍රාග්ධනය	8,627,173		24,311	
(ඇ) අරමුදල	(4,330,026)		(4,301,965)	
(ඈ) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන	5,409,112		1,857,159	
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		136,909,330		97,093,761

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

ඩබ්.ජේ.පී.එස්. මොලගොඩ
නියෝජ්‍ය මුල්‍යාධිකාරී

2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ

ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

	2010 රු.	රු.	2009 රු.	රු.
මෙහෙයුම් ආදායම්				
පුනරාවර්තන ආධාර		89,525,000		86,000,000
ක්‍රමක්ෂය		9,583,323		
වෙනත් ආදායම්				
(1) ණය සහ අත්තිකාරම් පොළී	809,686		862,047	
(2) විවිධ ලැබීම්	1,454,157		440,027	
(3) පොළී ආදායම	268,265		296,349	
(4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු	147,060		86,090	
(5) විභාග ගාස්තු	5,400		6,520	
(6) පුස්තකාල දඩ මුදල්	42,890		31,181	
(7) වෛද්‍ය ගාස්තු	18,530		24,030	
(8) දේපල වලින් වූ කුලී ආදායම්	190,965		201,682	
(9) ප්‍රකාශන විකුණුම්	-		637	
(10) පැරණි භාණ්ඩ විකුණුම් (රථ වාහන)	-		-	
(11) සම්බන්ධීකාරක ක්‍රියාකාරකම්	-		37,711	
(12) බාහිර පාඨමාලා ආදායම්	3,688,881			
		6,625,834		1,987,274
		105,734,157		**87,987,274**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි	69,320,645		62,790,391	
ගමන් වියදම්	214,634		227,967	
සැපයීම	4,242,138		4,127,666	
නඩත්තු	3,961,463		2,956,176	
ගිවිසුම් ගත සේවා	12,438,411		11,222,734	
පර්යේෂණ සහ සංවර්ධන	318,670		180,679	
ක්ෂය වීම්	9,583,323		10,192,869	
වෙනත් මෙහෙයුම් වියදම්	3,611,492		3,365,933	
පාඨමාලා වියදම්	3,688,881		-	
මුළු මෙහෙයුම් වියදම්		**107,379,657**		**95,064,415**
මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය)		**(1,645,500)**		**(7,077,141)**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. : පීඒ/එෆ්/ජබ්ලිව්පීඅයි/2010/එෆ්පී
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2011 මැයි 13 දින

අධ්‍යක්ෂ,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1), 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා(7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැළසුම්කිරීම, ක්‍රියාත්මකකිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාචෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA
දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ යොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල තියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි තියැදි පදනම මත පරීක්ෂා කිරීම , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කල යුතු වුවත් එලෙස ප්‍රයෝජනයට ගන්නා වාහන 07 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2. <u>ගණකාධිකරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණන තියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ එකතුව රු.148,199,683 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2011 මාර්තු 30 දිනැති කෙටුම්පත් වාර්තාවෙන් යොමුකරන ලදි . එයින් රු.6,379,688 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර 2011මාර්තු 31 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කෙරුණි. රු.141,819,995 ක ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර නොතිබූ අතර තවදුරටත් එවැනි අඩුපාඩු තිබීමේ ඉඩකඩ විගණනයේදී බැහැර කළ නොහැක.

(ආ) ජයසේකර ශිෂ්‍යත්ව අරමුදල හා ඊට අදාල පොලියේ එකතුව වූ රු.268,250 අරමුදල් යටතේ ගිණුම් ගත කරනු වෙනුවට ගෙවිය යුතු ශේෂයක් ලෙස අවසාන ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) ශිෂ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ටෙන්ඩර් ලේඛන 22 ක් සකස් කිරීමට උපදේශකවරුන්ට ගෙවූ රු.126,000ක මුදල විවිධ ආදායම් ගිණුමට හර කර තිබුණි

(ඈ) විද්‍යායතන පරිශ්‍රයේ තිබූ ගස් වලින් ඉරන ලද දැව තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) මධ්‍යම රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පවරා ගෙන තිබූ ආයුර්වේද රෝහලේ ස්ථාවර වත්කම් තවදුරටත් විද්‍යායතනයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

2.2.3. <u>නොසැසඳූ වෙනස්කම්</u>

ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති වත්කම් වර්ග 08 ක 2009 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු. 220,795,990 ක ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් උපලේඛනයෙහි එදිනට දැක්වෙන ශේෂයන් අතර රු. 141,425,745 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

2010 දෙසැම්බර් 28, දිනැති අංක 1692 දරන වවුචරයෙන්, ආයතනය පිළිබඳ සමාලෝචන කමිටුවේ සාමාජිකයින් හට තවාතැන් හා රාත්‍රී භෝජන සංග්‍රහය වෙනුවෙන් රු.30,000 අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර එම මුදල පියවීම 2010 දෙසැම්බර්30 දිනැතිව සිදු කර තිබූ නමුත් වියදමට අදාලව රිසිට්පත් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.5 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
අ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 165	වර්ෂ 5 කට වඩා පැරණි රු.78,555 ක් වූ මුදල් ඇණවුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබුණු අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි.
ආ. අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය අනුමත කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කරන විට මූල්‍ය වර්ෂයෙන් මාස 10 ක් ඉකුත් වී තිබුණ බැවින් ආයතනය අයවැය පාලනයෙන් බැහැරවී තිබුණි.

3 **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

3.1 **මූල්‍ය සමාලෝචනය**

3.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්පය සඳහා විද්‍යායතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණනට ගැනීමට පෙර රු.100,753, 823 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්පයේ ඌනතාවය රු.93,077,141 ක් විය. සමාලෝචිත වර්පයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.89,525.000 ක් වූ රජයේ ප්‍රදානය ගණනට ගත් පසු එම ඌනතාවය රු.11,228,823 දක්වා අඩුවී තිබුණු අතර ඉකුත් වර්පය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබී තිබූ රු. 86.000,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්පයේ ඌනතාවය රු. 7,077,141 ක් දක්වා අඩු වී තිබුණි.

3.2 **මෙහෙයුම් සමාලෝචනය**

3.2.1 **කාර්යසාධනය.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. අධ්‍යයන කාර්යසාධනය

2009/2010 අධ්‍යයන වර්ෂයේ විද්‍යායතනයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 151 ක් වන අතර ඉන් සිසුන් 08 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාල වලට මාරු කර යවා ඇති අතර සිසුන් 25 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි. මේ අනුව වර්ෂය අවසාන වන විට විද්‍යායතනයේ අධ්‍යාපනය හදාරමින් සිටි තවක සිසුන් සංඛ්‍යාව 118 ක් හෙවත් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 78% ක් විය. ඒ අනුව විද්‍යායතනයේ සම්පත් ඌන උපයෝජිත බව නිරීක්ෂණය විය.

ආ. විභාග ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ විභාග සඳහා පෙනී සිටි සිසුන් 170 කින් විභාග සමත් සිසුන් සංඛ්‍යාව 107 ක් එනම් 63% ක් වූ අතර ඌන සමත් සිසුන් සංඛ්‍යාව 56 ක් එනම් 33% ක් බව නිරීක්ෂණය විය.

ඇ. විෂය නිර්දේශ සංශෝධනය

2001 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය හා විභාග නිර්නායක ගුණාත්මක හා ව්‍යුහාත්මක වර්ධනයක් උදෙසා සංශෝධනය කිරීම සඳහා 2005 වර්ෂයේදී කමිටුවක් පත්කර ඇතත්, 2011 මාර්තු 30 දින වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි.

3.2.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

මසකට රු.31,000 ක පිරිවැයක් දරමින් 128 kbps ධාරිතාවයක් ඇති අන්තර්ජාල සබඳතාවක් භාවිතා කරනු ලබන අතර එහි ධාරිතාවය ආයතනයට ප්‍රමාණවත් නොවීම නිසා අන්තර්ජාලයට ඇතුළුවීමට සිසුන්ට බොහෝ වේලා රැඳී සිටීමට සිදුවීමෙන් ඔවුන් අපහසුතාවට පත්වන බව නිරීක්ෂණය විය.

3.2.3 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. රු.824,000 ක පිරිවැයකට බාහිර පාර්ශවයක් විසින් පිළියෙල කරන ලද පරිගණක පද්ධතිගත කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් සමාලෝචිත වර්ෂයේ දී ආයතනයට භාරදී තිබුණද ලේඛනය ලැබීමෙන් පසු වර්ෂය තුළ අත්පත්කරගත් ප්‍රාග්ධන වත්කම් ඇතුලත් කර එය යාවත්කාලීන කර නොතිබුණි. එකම රහස් යතුරකින් මෙම ලේඛනය කියවීමට හා තොරතුරු ඇතුලත් කිරීමට හැකිවීමෙන් මෙම ලේඛනයේ ආරක්ෂාව හා නිවැරදිතාවය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් පැවතීම, කේත අංක අනුව වත්කම් ගිණුමට පිවිසීමට නොහැකි වීම , වත්කම් පවතින ස්ථානය වෙනස් කිරීමේදී එය ඇතුලත් කර නොගැනීම නිසා නව ස්ථානය හඳුනාගැනීමට නොහැකිවීම යනාදී කරුණු හේතුවෙන් වත්කම් පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණි.

ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කිරීමේදී පුස්තකාල පොත් භෞතිකව පරීක්ෂා කොට නොතිබූ අතර පරිග්‍රහන ලේඛණයේ දැක්වෙන ආකාරයට ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර තිබුණි. පුස්තකාල පොත් ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කිරීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී පරිග්‍රහන ලේඛණයේ දැක්වෙන මිල ගණන් හා ස්ථාවර වත්කම් ලේඛණයේ දැක්වෙන මිල ගණන් අතර රු.3,460 සිට රු.43,000 දක්වා නොසැසඳීම් නිරීක්ෂණය විය.

ආ. ශරීර ඒකකයේ මෘතදේහ සීරු මාරු කිරීම, මෘතදේහ සංරක්ෂණය, ශරීර කොටස් එකලස් කිරීම හා පවිත්‍රතා කටයුතු සඳහා අවශ්‍යවූ කම්කරු තනතුරු දෙකක් වසර දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුනි.

3.2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. වතුපිටිවල ඖෂධ උද්‍යානය වටා කම්බි වැටක් ඉදිකිරීම වෙනුවෙන් පිළියෙල කරන ලද රු. 1,986,650 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා වැඩ ඉංජිනේරුවරයාගේ සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම කාර්යය සඳහා වරින් වර මිල ගණන් කැඳවා කොටස් වශයෙන් ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර එම මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. මේ වෙනුවෙන් වැයකරන ලද රු.1,129,491 ක් සඳහා මුදල් කමිටුවේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

ආ. පහල වීදියවත්ත සේවක නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා රු.223,608 ක් පිරිවැය වූ ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. එම ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර තිබූ අතර මිලදී ගත් ද්‍රව්‍ය අතර රු 158,118 ක කොන්ක්‍රීට් නිෂ්පාදන අදාල නිෂ්පාදිත ආයතනයෙන් මිල දී නොගෙන එම නිෂ්පාදනයම වෙනත් ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) වාහන පාලනය

(ඇ) ගබඩා පාලනය

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) ස්ථාවර වත්කම්

එච්.ඒ.එස්.සමරවීර

වැඩබලන විගණකාධිපති

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැළණිය විශ්වවිද්‍යාලය, යක්කල.

GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, YAKKALA.

අධ්‍යක්ෂ Director	033-2222739	නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන) Deputy Registrar (Admin)	033-2226618	නියෝජ්‍ය මූල්‍යාධිකාරී Deputy Bursar	033-2223785
		ෆැක්ස්/Fax	033-2223784	ෆැක්ස්/Fax	033-2223785
ෆැක්ස් Fax	033-2222739	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග) Senior Assistant Registrar (Exams)	033-2223784	සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්) Assistant Bursar (Supplies)	033-3340105
කාර්යාලය General Office	033-2222740-2222748 033-3340101	සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) Assistant Registrar (Student affairs)	033-3340106	ඊ මේල් E-mail	ayurgmp@sltnet.lk

මගේ අංකය My Number } ජී.ඩබ්.ඒ.අයි./ඒසී 04/විගණන   ඔබගේ අංකය Your Number } සීඊඑෆ්.ඩබ්ඒඅයි.2010එෆ්ඒ   දිනය Date } 2011.07.07

එච්.ඒ.එස් සමරවීර,
වැ.බ. විගණකාධිප.ති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

මහත්මයාණෙනි,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඉහත සඳහන් වාර්තාව සම්බන්ධයෙන් මේ වන විට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් දක්වමි.

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු යොදන බව දන්වමි.

2.2.2 **ගණකාධිකරණ අඩුපාඩු**

(අ) වාර්තාවේ දක්වා තිබූ ගණකාධිකරණ අඩුපාඩු ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේ දී අවධානයට යොමු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි

(ආ) නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත.

(ඇ) එකඟ වෙමි. ඉදිරියේදී මෙවැනි අඩු පාඩු සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි.

(ඈ) විද්‍යායතන පරිශ්‍රයේ තිබූ ගස්වලින් ඉරා දුව ලබාගැනීම සඳහා දරණ ලද වියදම එම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති අතර එම දුව ආයතනයේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු වෙනුවෙන් භාවිතයට ගෙන ඇත. කෙසේ වුව ද විගණනය දක්වා ඇති පරිදි අතපසු වීමකින් ගිණුම්ගත කර නොමැති තොග වටිනාකම් පිළිබඳ අඩුපාඩු නිවැරදි කර ගැනීමට එකඟ වෙමි.

(ඉ) මේ සම්බන්ධයෙන් දැනට ආයුර්වේද දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර වත්කම් වටිනාකම් තක්සේරු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, තක්සේරුවෙන් අනතුරුව අදාල වත්කම් වටිනාකම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.

2.2.3 <u>නොසැසඳූ වෙනස්කම්</u>

ස්ථාවර වත්කම් ලේඛනය සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පවත්නා ශේෂ අතර වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි.

2.2:4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

ජර්නල් අංක 2010/266 මගින් එම අත්තිකාරම පියවා ඇති අතර, මේ සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට දරන ලද වියදම් සඳහා පැහැදිලි විස්තර සහිතව ඉදිරියේදී බිල්පත් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත.

2.2.5 <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

(අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 165</u>

මේ සම්බන්ධයෙන් 2011.06.23 දිනැති යක්කල මහජන බැංකු කළමනාකරු විසින් එවා ඇති ලිපියට අනුව එම මුදල් කඩිනමින් මෙම ආයතනයට ලබාදෙන බැව් දන්වා ඇත.

(ආ) <u>අංක PED/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u>

මූල්‍ය වර්ෂය ආරම්භ වීමට පෙර අදාල අයවැය ඇස්තමේන්තුව කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ඇත. එම ඇස්තමේන්තුවට අදාල අනුමත ප්‍රතිපාදන අනුව පිළියෙල කරනු ලැබූ අවසන් අයවැය වාර්තාව සඳහා ද කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. 2010 වර්ෂයෙ දී අයවැය සඳහා අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වී ඇත්තේ එම වර්ෂයට අදාල ප්‍රතිපාදන වාරික 3 කදී ලබාදීම හේතුවෙනි.

3. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

3.2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.2.1 <u>කාර්ය සාධනය</u>

අ <u>අධ්‍යයන කාර්යසාධනය</u>

2009/2010 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වරින් වර එවනු ලැබූ නාම ලේඛන ලැයිස්තු වලට අනුව ලියා පදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 151 වුව ද මෙම සිසුන් අතරින් කිසියම් ශිෂ්‍ය ප්‍රමාණයක් පාඨමාලා උසස්වීම, සහ මාරු වීම වැනි හේතුන් නිසා වෙනත් විශ්වවිද්‍යාල වෙත ගොස් ඇත. නමුත් 2010 වර්ෂය සඳහා අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 120 ක් වන අතර, ඉන් 118 ක් අධ්‍යයන කටයුතුවල නිරත වී සිටීම නිසා ඌන උපයෝගී තාවයක් නොමැත.

ආ <u>විභාග ප්‍රතිඵල</u>

පවතින විභාග නිර්නායක අනුව සිසුන් සමත් වීම හෝ අසමත් වීම එම විභාගයට පෙනී සිටින සිසුන්ගේ කුසලතාවය මත රඳා පවතී.

ඇ <u>විෂය නිර්දේශ සංශෝධනය</u>

විෂය නිර්දේශ සංශෝධනය සම්බන්ධයෙන් දැනට කටයුතු කෙරෙමින් පවතී.

3.2.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

විද්‍යායතනය සඳහා ලබාගන්නා අන්තර්ජාල සම්බන්ධතාව ධාරිතාව 256 KBPS දක්වා වැඩි කිරීම සඳහා මුදල් කමිටු අනුමැතිය ලබා ඇති අතර, ඒ අනුව කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි.

3.2.3 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

අ. පරිගණක පද්ධති ගත කරන ලද ස්ථාවර වත්කම් ලේඛණයෙහි ආයතනයට අත්පත්කරගන්නා ප්‍රාග්ධන වත්කම් ඇතුලත් කර යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී.

මේ සම්බන්ධයෙන් පවත්නා රහස් යතුර සැපයුම් අංශ භාර සහකාර මූල්‍යාධිකාරී සහ අදාල විෂයභාර ලිපිකරු මහතා විසින් පමණක් භාවිතා කරන බැවින් එම ලේඛණයේ ආරක්ෂාව පවතී. දැනට පවත්නා අඩුපාඩු නිවැරදිව හඳුනාගෙන ඒ අඩුපාඩු නිවැරදි කර ගැනීමට ද කටයුතු කරන බව දන්වමි.

ආ. ශරීර ඒකක අංශයේ කටයුතු කිරීම වෙනුවෙන් විද්‍යාගාර සහායක වරයෙක් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව දන්වමි.

3.2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

අ. වතුපිටිවල ඖෂධ උද්‍යානය වටා තාප්පය ඉදිකිරීම සඳහා වැඩ ඉංජිනේරු මහතාගෙන් ලබා ගත් ඇස්තමේන්තුව ඉතා ඉහල අගයක් වූ අතර එවැනි මුදලක් දැරීමට ආයතනයට නොහැකි වූයෙන් කම්බි වැට ඉදි කිරීමේ කටයුතු සිදු කොට ඒ සඳහා සැපයුම් කමිටු හා මුදල් කමිටු අනුමැතිය ලබා ගෙන ඇත

ආ. හදිසියේ සිදු කලයුතුව තිබූ සේවක නිල නිවාස අලුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත එම ද්‍රව්‍ය මිල දී ගැනීම සිදු කර ඇත.

ඇ. ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සහිතව සැපයුම් ඇණවුම භාර දෙන ලද අතර, එම ඇණවුමට අනුව ප්‍රමිතියෙන් යුතු දව නොසැපැයීම නිසා ප්‍රතික්ෂේප වූයෙන් එම දව අදාල සැපැයුම්කරු විසින් ආපසු ගෙන ගොස් ඇත.

3.2.5 **ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය පෙර වර්ෂයට වඩා පහල මට්ටමක පවත්වා ගැනීමට හැකි වී ඇත.

3.2.6 **ඌනා උපයෝජිත වත්කම්**

2010.12.31 දිනට පැවති ශේෂය ආයතනයේ ඉදි වෙමින් පවත්නා ගොඩනැගිලි සහ වෙනත් විවිධ ගෙවීම් සම්බන්ධයෙන් පැවති ශේෂ මුදලකි.

3.2.7 **පුස්තකාල පරිපාලනය**

අ. පුස්තකාල පොත් පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු යොදා ඇති අතර එම සමීක්ෂණ තොරතුරු අනුව පොත්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමට කටයුතු කරනු ඇත.

ආ. ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආපසු භාර දී නොමැති පොත් සඳහා රු. 15,343/- ක් මේ වන විටත් ඔවුන්ගේ වැටුපෙන් අයකර ඇත. ශිෂ්‍යයින්ගෙන් ලබාගතයුතු පොත් ලෙස දක්වා තිබූ පොත් 229 න් දැනට ලබා ගැනීමට ඉතිරිව ඇත්තේ පොත් 179 ක් පමණි. මේ අනුව ඉතිරි ප්‍රමාණයන් ද ලබා ගැනීම සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු සිදු කෙරෙමින් පවතී.

4. <u>පද්ධති හා පාලන</u>

පද්ධති හා පාලන යටතේ දක්වා ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කොට කටයුතු කිරීමට එකඟ වෙමි.

අධ්‍යක්ෂ,
මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ

පිටපත් -

1.	උපකුලපති	- කැලණිය විශ්වවිද්‍යාලය
2.	සභාපති	- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3.	ලේකම්	- උසස් අධ්‍යාපන අමාත්‍යංශය
4.	ලේකම්	- මුදල් හා ක්‍රම සම්පාදන අසාත්‍යංශය